## මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2016

---

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ එවකට ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්පී 99 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් පුනරුත්ථාපනය කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ඇතුළු මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් නිර්මාණය කිරීමෙන් වඩා හොඳ සනීපාරක්ෂක පහසුකම් මගින් මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 සැප්තැම්බර් 20 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණකක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ ( විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන වග.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

## 2.2. නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

---

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වගන්තිය අනුව, රු.මිලියන 5 හෝ ඊට වඩා වටිනාකම වූ කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතු වේ. තවද, කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු දින 60 ක් තුල කොන්ත්‍රාත් ගිවිසුම් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතු වේ. ව්‍යාපෘතිය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹී කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකු ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවූ බව නිරීක්ෂණය විය.

## 2.3 සැසඳුම් නොකළ ශේෂයන්

---

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතිය විසින් ඉටුකල කාර්යයන්ගේ කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.මිලියන 3,251.09 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු. මිලියන 2,586.95 ක් ලෙස දැක්වුණි. රු.මිලියන 664.14 ක් වූ වෙනස සංසන්දනය කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---

### 3.1 අරමුදල් උපයෝජනය

---

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යයනය කිරීම සඳහා ණය ගිවිසුමේ එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන. | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ජජාසනි | 14,087 | 17,922 | 4,187 | 747.61 | 1,017.60 | 2,118.51 | 2,725.58 |
| ශ්‍රීලංර | 3,191 | 4,060 | 144 | - | 94.38 | - | 393.27 |
| | ---------- | --------- | -------- | --------- | --------- | ----------- | ----------- |
| | 17,278 | 21,982 | 4,331 | 747.61 | 1,111.98 | 2,118.51 | 3,118.85 |
| | ====== | ====== | ===== | ===== | ===== | ====== | ====== |

ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලය ආවරණය වන පරිදි ව්‍යාපෘතියේ අරමුණු ළඟාකරගැනීම සහතික කරනු වස්, වෙන්කල සම්පත් උපයෝගී කරගෙන නියමිත කාලසීමාව තුළ මූල්‍ය හා භෞතික ඉලක්ක කැපීපෙනෙන ලෙස දක්වමින් විස්තීර්ණ සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 05 ක් ගතවීමෙන් පසුව 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් වූ මුළු වෙන් කිරීම් අතුරින් සියයට 15 ක් නියෝජනය වන රු.මිලියන 2,725.58 කට සමාන ජපන් යෙන් මිලියන 2,118.51 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඊට අමතරව, 2016 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද රු.මිලියන 4,187 ක් අතුරින්, සියයට 24 කට සමාන රු.මිලියන 1,017.60 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

------------------------------

ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 27.71 ක් හා සියයට 16.26 ක් ලෙස දැක්වුණි. ප්‍රධාන පැකේජ 04 ක් යටතේ ව්‍යාපෘතියේ සිවිල් කොන්ත්‍රාත් වැඩ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,077 කට සමාන ජපන් යෙන් මිලියන 12,636 කට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණු අතර ඉන් සිවිල් ඉදිකිරීම් සඳහා වූ පැකේජ 02 ක් 2016 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්යයන් සියයට 47 ක් හා සියයට 60 ක ප්‍රමාදයක් සහිතව එම කාලසීමාවේ සියයට 20 ක් හා සියයට 33 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්වා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කළ අනෙක් කොන්ත්‍රාත් දෙක 2016 අවසාන වන විටත් ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

කොන්ත්‍රාත් ගිවිසුම අනුව, අපජලය පිලියම් කිරීමේ පිරියත, ප්‍රධාන පොම්පාගාරය, පිරිසිදු අපවහන ඉවත්කිරීමේ පද්ධතිය, මඩ වියලි තටාංගනය සැලසුම් කිරීම හා ඉදිකිරීම සහ මෙහෙයුම් හා නඩත්තු උපකරණ සැපයීම සඳහා මූලික වාර්තා හා ව්‍යාපෘතියේ විස්තරාත්මක සැලස්ම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර මාස 10 ක් තුළ සම්පූර්ණ කල යුතුව තිබුණි. එසේ වුවද, සැලැස්ම සකස් කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 80 ක් ගෙවා තිබුණද, 2016 දෙසැම්බර් 31 වන විටත් මූලික විස්තරාත්මක සැලසුම සම්පූර්ණ කර නොතිබුණි.

**3.4 මූල්‍ය පාලනයේ දූර්වලතා**

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 16,061 කට ව්‍යාපෘතිය ප්‍රසම්පාදනය කල දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 756 මඟින් නියමකර ඇති පරිදි, සමාලෝචිත වර්ෂය තුල භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.